Nations Trust Bank

හිතවත් ගණුදෙනුකාර භවතුනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ගණුදෙනුකරුවනගේ ප්‍රඥාප්තිය යටතේ වන අවශ්‍යතාවයක් අනුව, අප විසින් සපයනු ලබන බැංකු සේවා වලින් ඔබට අවශ්‍ය සහ අදාළ වන සේවා තෝරා ගැනීම සඳහා සහය වීමට මෙම 'මූලික විස්තර පත්‍රිකාව' නැමැති ප්‍රකාශන මාලාව අප විසින් පිළියෙල කරනු ලැබ ඇත.

නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ පෞද්ගලික බැංකුකරණය වෙතින් පිරිණමන විවිධ මාදිලියේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් සමග ගිණුම් වලට අදාළ විශේෂ පැකේජයන් සහ විදේශ ව්‍යවහාර මුදල් පෞද්ගලික ගිණුම් පිළිබඳ පුළුල් විස්තරයක් මෙම මූලික විස්තර පත්‍රිකාව මගින් ඔබට ලබා දෙයි.

කෙසේ වුවද නීතිමය හා පාලන වෙනස්කම් අනුව සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිවල සිදුවන වෙනස්කම් අනුව මෙහි පහත දක්වා ඇති මූලික විස්තර පත්‍රිකාවේ ඇතුළත් කරුණු ප්‍රතිශෝධනය විය හැකි බව කරුණාවෙන් සළකන්න.

පහත දක්වා ඇති ආකාරයට අප හා සම්බන්ධ වීමෙන් ඔබට මේ හා සම්බන්ධ වැඩි විස්තර දැනගත හැක. අපගේ වෙබ් අඩවිය වන www. nationstrust.com වෙත පිවිසීම මගින් හෝ 011 4711 411 හරහා පැය 24 පුරාම ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඇමතීම මගින්.

පහතින් දක්වා ඇති ගිණුම් වලින් ඔබේ ගිණුමකට අදාළව යම් පැමිණිල්ලක් සිදු කිරීමට ඇත්නම් කරුණාකර කෙටියෙන් ලියන ලද පැමිණිල්ල ඇතුළත් ලිඛිත ප්‍රකාශයක් අප වෙත ඉදිරිපත් කරන්න, එයට කඩිනමින් ප්‍රතිචාර දක්වීම සඳහා අපි බැඳී සිටින්නෙමු. පැමිණිලි සඳහා **පැමිණිළි විසඳීම් නිලධාරි, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, නො. 242, යුනියන් පෙදෙස, කොළඹ 02.** අපගේ දුරකථන අංකය **(+94 114 711 411)** ඊ-මේල් **customerservice@nationstrust.com**

## ඉතිරි කිරීමේ ගිණුම්

| ගිණුම් පිළිබඳ විස්තරය | ගණුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ | ගිනුම් විවෘත කිරීම සඳහා අනුගමනය කලයුතු කාර්ය පටිපාටිය | ගිණුම් විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය. | ප්‍රධාන නියම හා කොන්දේසි |
|---|---|---|---|---|
| නේෂන්ස් සේවර් පාස්පොත සහිත ඉතුරුම් ගිණුම<br>මෙය පොළිය ලැබෙන ගිණුමකි' බැංකුව විසින් ගණුදෙනුකරු වෙත ත්‍රෛමාසික ගිණුම් ප්‍රකාශන ගණුදෙනුකරුගේ තීරණය මත තැපැලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් එවනු ලැබේ' | • ගිණුමේ ශේෂය මත පදනම් වූ පොළී අනුපාත<br>• ඩිජිටල් බැංකුකරණ පහසුකම්<br>• ගාස්තු රහිත විද්‍යුත් ප්‍රකාශණ පහසුකම් | • ගිණුමේ ඇති අවම මාසික ශේෂය ශ්‍රී ලංකා රුපියල් 1,000/- වඩා අඩු වුවහොත් මාසිකව ගාස්තුවක් අය කරනු ලැබේ.<br>• ගිණුම වැසීමේ ගාස්තුව | බැංකුවේ ඉතුරුම් ගිණුම් විවෘත කිරීමේ සාමාන්‍ය අයඳුම් පත්‍රය පුරවා පහත දැක්වෙන ලේඛන ද සමඟ බැංකු ශාඛාවක් වෙත ඉදිරිපත් කළ යුතු ය.<br>• ජාතික හැඳුනුම්පතේ හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්<br>• ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ ඇති නේවාසික ලිපිනයට වඩා වෙනස් ලිපිනයක් අයඳුම් පත්‍රයේ සඳහන් කරන්නේ නම් එම ලිපිනය සනාථ කිරීමට ලේඛනගත සාක්ෂියක් | සුදුසුකම්ලත් තැනැත්තන්:<br>වලංගු ජාතික හැඳුනුම්පතක්/වලංගු විදේශ ගමන් බලපත්‍රයක් දරන වයස අවුරුදු 18 වැඩි නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියන්<br>• අවම ආරම්භක තැන්පතුව රුපියල් 2,000/- ක් වේ.<br>• කාලානුරූපව බැංකුව විසින් නිගමනය කරනු ලබන පොළී අනුපාත අනුව පොළිය උපචිත වේ.<br>• දෛනිකව පවතින ගිණුම් ශේෂය මත පොළිය ගණනය කර මාසය අවසානයේ දි ගිණුමට බැර කරනු ලැබේ. |
| නේෂන්ස් සේවර් ගිණුම් ප්‍රකාශන ඉතුරුම් ගිණුම<br>බැංකුව විසින් ගණුදෙනුකරු වෙත පාස් පොතක් ලබාදෙන අතර එම පාස්පොත බැංකුවට ඉදිරිපත් කරනු ලබන අවස්ථාවල දි හර කිරීම්, බැර කිරීම් සහ ගිණුම් ශේෂයන් එහි යාවත්කාලින කරනු ලැබේ' | • ගිණුම් ශේෂය මත පදනම් වූ පොළී අනුපාත<br>• ඩිජිටල් බැංකුකරණ පහසුකම්<br>• පාස්පොත | • නව පාස්පොතක් නිකුත් කිරීමේ ගාස්තු<br>• ගිණුම වැසීමේ ගාස්තුව | බැංකුවේ ඉතුරුම් ගිණුම් විවෘත කිරීමේ සාමාන්‍ය අයඳුම් පත්‍රය පුරවා පහත දැක්වෙන ලේඛන ද සමඟ බැංකු ශාඛාවක් වෙත ඉදිරිපත් කළ යුතු ය.<br>• ජාතික හැඳුනුම්පතේ හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්<br>• ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ ඇති නේවාසික ලිපිනයට වඩා වෙනස් ලිපිනයක් අයඳුම් පත්‍රයේ සඳහන් කරන්නේ නම් එම ලිපිනය සනාථ කිරීමට ලේඛනගත සාක්ෂියක් | සුදුසුකම්ලත් තැනැත්තන්:<br>වලංගු ජාතික හැඳුනුම්පතක්/වලංගු විදේශ ගමන් බලපත්‍රයක් දරන වයස අවුරුදු 18 වැඩි නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියන්<br>• අවම ආරම්භක තැන්පතුව රුපියල් 10,000/- ක් වේ. |

| | | | | |
|---|---|---|---|---|
| **නේෂන්ස් මෙගා සේවර් ඉතුරුම් ගිණුම**<br>මෙය ඉහළ මුදල් තැන්පතු සඳහා සාමාන්‍ය ඉතුරුම් ගිණුම් පොළී අනුපාතයට වඩා වැඩි පොළී අනුපාතයක් ලබා දෙන ඉතිරි කිරීමේ ගිණුමකි. | • ගිණුම් ශේෂය මත පදනම් වූ පොළී අනුපාත | • ගිණුම වැසීමේ ගාස්තුව | බැංකුවේ ඉතුරුම් ගිණුම් විවෘත කිරීමේ සාමාන්‍ය අයදුම් පත්‍රය පුරවා පහත දැක්වෙන ලේඛන ද සමඟ බැංකු ශාඛාවක් වෙත ඉදිරිපත් කළ යුතු ය.<br>• ජාතික හැඳුනුම්පතේ හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්<br>• ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ ඇති නේවාසික ලිපිනයට වඩා වෙනස් ලිපිනයක් අයදුම් පත්‍රයේ සඳහන් කරන්නේ නම් එම ලිපිනය සනාථ කිරීමට ලේඛනගත සාක්ෂියක් | සුදුසුකම්ලත් තැනැත්තන්:<br>වලංගු ජාතික හැඳුනුම්පතක්/වලංගු විදේශ ගමන් බලපත්‍රයක් දරන වයස අවුරුදු 18 වැඩි නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියන්<br>• අවම ආරම්භක තැන්පතුව රුපියල් මිලියනය 3 ක් වේ.<br>• ශේෂය රුපියල් මිලියනයනට වඩා අඩු නම් පොළිය නොලැබෙනු ඇත. |
| **නේෂන්ස් මනි මාර්කම් ඉතුරුම් ගිණුම**<br>මෙම ගිණුම මගින් නිතිපතා ඉතිරි කරන ගිණුම් හිමියාට ඉතුරුම් ගිණුමක ඇති නම්‍යශීලිභාවය බුක්ති විඳින අතරම ඉහළ ප්‍රතිලාභ අත් විඳීමේ අවස්ථාව ලබා දෙයි. | • පොළිය, සහතික කළ අවම පොළී අනුපාතයක් සහිත මුදල් වෙළඳපොල පොළී අනුපාතය හා සම්බන්ධ වී ඇත. | • ගිණුමේ අවම මාසික සාමාන්‍ය ශේෂය රුපියල් 1,000/- වඩා අඩුවන විට සේවා ගාස්තුවක් අය කරගනු ලැබේ.<br>• ගිණුම වැසීමේ ගාස්තුව | බැංකුවේ ඉතුරුම් ගිණුම් විවෘත කිරීමේ සාමාන්‍ය අයදුම් පත්‍රය පුරවා පහත දැක්වෙන ලේඛන ද සමඟ බැංකු ශාඛාවක් වෙත ඉදිරිපත් කළ යුතු ය.<br>• ජාතික හැඳුනුම්පතේ හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්<br>• ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ ඇති නේවාසික ලිපිනයට වඩා වෙනස් ලිපිනයක් අයදුම් පත්‍රයේ සඳහන් කරන්නේ නම් එම ලිපිනය සනාථ කිරීමට ලේඛනගත සාක්ෂියක් | සුදුසුකම්ලත් තැනැත්තන්:<br>වලංගු ජාතික හැඳුනුම්පතක්/වලංගු විදේශ ගමන් බලපත්‍රයක් දරන වයස අවුරුදු 18 වැඩි නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියන්<br>• අවම ආරම්භක තැන්පතුව රුපියල් 50,000/- ක් වේ.<br>• ශේෂය රුපියල් 50,000/- වඩා වැඩි නම් පමණක් පොළිය ලැබෙනු ඇත. |